**විෂයය කේතය : DVST E 2025**

**වර්ගය : හර**

**මාතෘකාව : තිරසර සංවර්ධනය**

**ඉගෙනුම් ඵල :-**

මෙම විෂයය ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු විද්‍යාර්ථීන් තිරසර සංවර්ධනය සංකල්පය හා එය පරිණාමීය ක්‍රියාවලියක් ලෙසත් අවබෝධය ලබන්නේය. එමෙන්ම සංවර්ධන ක්‍රියාවලියෙහි තිරසරත්වය හා එය සාධනය කර ගැනීමේ සාධ්‍යතාවයන් පිළිබඳවත් අවබෝධයක් විද්‍යාර්ථ ලබා ගත යුතුය.

ගෝලීය සංදර්භය තුළ තිරසරත්වය හා මානව පරිසරයෙහි මතුවූ ගැටලු ලෙස පාරිසරික පිරිවැය, පාරිසරික අවක්‍රමණය හා පිරිහීම, අපද්‍රව්‍ය ගැටලු ආදිය පිළිබඳව අවබෝධය පාරිසරික අර්බුදයෙහි ජාතික, කලාපීය හා ගෝලීය වශයෙන් මතු වී ඇති ගැටලු හා ඒවාට ඉදිරිපත් කළ හැකි විසඳුම් හඳුනාගැනීමට හා විශ්ලේෂණය කිරීමට විද්‍යාර්ථීයාට හැකියාව ලබන්නේය. අවසානයේදී සංවර්ධන ක්‍රියාවලිය තිරසර ලෙස ප්‍රවර්ධනය කිරීමටත් , ඒ සඳහා කටයුතු කිරීමටත් විද්‍යාර්ථීන්ට හැකි වන්නේය.

**විෂය අන්තර්ගතය :**

තිරසර සංවර්ධනය සංකල්පය පිළිබඳ හඳුනාගැනීම, තිරසර සංවර්ධන සංකල්පයේ පසුබිම, සංවර්ධන ක්‍රියාවලියෙහි තිරසර සංවර්ධන ප්‍රවේශය,එය ක්‍රියාත්මක කිරීමට ජාතික හා ගෝලීය වශයෙන් සිදුවන මැදිහත්වීම්, අවකාශය හා කාලය අනුව තිරසර සංවර්ධන භාවිතයන්හි වෙනස් වීම, තිරසර සංවර්ධනය සඳහා දේශීය දැනුමෙහි ඇති වැදගත්කම.

මීට අමතරව භෞතික පරිසරයෙහි මූලිකාංග, මානව ක්‍රියාකාරකම් සහ පරිසර (පරිසර පද්ධතිය) අන්තර් ක්‍රියාකාරීත්වයෙහි තුළ ගැටලු හඳුනාගැනීම, ලෝක සංවර්ධනය තුළ ප්‍රතිපත්තින්හි පවතින ප්‍රධාන පාරිසරික ගැටලු වල ඉතිහාසය, පරිසරය කෙරෙහි බලපා ඇති මානව බලපෑම, ලෝක සංවර්ධනය සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය හා නීතිමය ක්‍රියාමාර්ග හඳුනාගැනීම සිදු කෙරේ.

**ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේද :**

මෙම විෂය තුළදී විෂය ආකෘති, සම්මන්ත්‍රණ, LMS (Powerpoint ඉදිරිපත් කිරීම්) අන්තර්ජාල පරීක්ෂාකිරීම් සහ ස්වයං අධ්‍යන යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීම් ක්‍රමය :** වර්ෂ අවසාන පරීක්ෂණය

**ආශ්‍රිත ග්‍රන්ථ:**

Adams, W.M (2009), Green Development: Environment and sustainability in a Developing World. Rutledge Taylors and Francis Group publication: London and New York

Report of the World Commission on Environment and Development: Our Common Future (1987). Oxford University press, United Nation, USA.

Report of Sustainable Development Strategies.(2002). Economic Co-operation and Development, Paris and United Nations Development Programme, Earth scan Publications Ltd, New York

Meadowers, D.H., Meadowers, D.L & Renders, J. (1992). Beyond the limits: Global Collapse or a sustainable future earth scan, London.

අමරසිංහ ඒ.පී.(2012). ජනසංඛ්‍යාව සහ සංවර්ධනය, කතෘ ප්‍රකාශන